# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.
**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org


**ජනාධිපතිවරණය 2015,**

**තැපැල් ඡන්ද විමසීම - මාධ්‍ය නිවේදන 02**

2014-12-23 වන දින කොළඹ - ශ්‍රී ලංකාව

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය(මැ.ප්‍ර.නි.ම.) 2015 ජනාධිපතිවරණයේ තැපැල් ඡන්ද සළකුණු කිරීමේ පළමු දින වූ අද දින දිවයින පුරා නිරීක්ෂණයේ නිරත වූ අතර බරපතළ සිද්ධීන් 20ක් සහ සුළු සිද්ධීන් 27ක් ඇතුලුව සමස්ථ සිද්ධීන් 47ක් වාර්තා කරන ලදී. පහර දීම් තර්ජනය හා බලපෑම් කිරීම් , මැතිවරණ නිලධාරීන් සිදු කරන වැරදි සහ බලහත්කාරයෙන් ඡන්ද මධ්‍යස්ථාන අසළ රැඳී සිටීම බරපතළ සිද්ධීන් ගණයට ඇතුළත් වේ. මැතිවරණ වැරදිවලට අදාළ ව අනෙකුත් සියලු සිද්ධීන් සුලු සිද්ධීන් ලෙස වර්ගීකරණය කර ඇත.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය,

දෙසැම්බර් 23, 24, 26 සහ 30 යන දිනයන්හි දී තැපැල් ඡන්දය සළකුණු කිරීම සඳහා ඡන්දදායකයින් 541, 831 ක් සුදුසුකම් ලබා ඇති බවට මැ.ප්‍ර.නි.ම. දැනුවත්ව සිටී. තැපැල් ඡන්දය සළකුණු කිරීමේ පළමු දිනය වූ අද දිනයේ වාර්තා වූ සිද්ධි ගණනාවක් නිසා මැතිවරණයේ විනිවිද බව කෙරෙහි බලපෑමක් කළ හැකි තැපැල් ඡන්ද ලියාපදිංචි කිරීම සඳහා යොදා ගනු ලබන ක්‍රියාවලිය කෙරෙහි මැ.ප්‍ර.නි.ම. සිය දැඩි අවධානය යොමු කර සිටී. ඒ අනුව තැපැල් ඡන්ද සඳහා අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමේ වර්තමාන භාවිතය කෙරෙහි මැ.ප්‍ර.නි.ම. සිය දැඩි අවධානය යොමු කර සිටින අතර මෙම ආයතන ප්‍රධානීන් සිදු කරන්නා වූ ප්‍රමාදයන් සහ හෝ විෂමතාවන් හේතුවෙන් සැලකිය යුතු ඡන්දදායකයින් පිරිසකගේ ඡන්ද බලය අහිමි වීමට හේතු විය හැකි බව මැ.ප්‍ර.නි.ම. විශ්වාසයයි. මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වන ආකාරයට අයදුම්පත් යොමු කිරීමේ ප්‍රමාදය නිසා ආසන්න වශයෙන් 85,000ක පිරිසකගේ තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වී ඇත. මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වූ සුවිශේෂ සිද්ධියක් වන්නේ පුත්තලම අධ්‍යාපන කලාප කාර්යාලයෙන් එකවර තැපැල් කරන ලද අයදුම්පත් 140කින් අයදුම්පත් 30ක් ප්‍රමාද වීමේ හේතුව මත ප්‍රතික්ෂේප වී තිබීමයි. සැලකිය යුතු පුරවැසියන් පිරිසකගේ ඡන්ද බලය අහිමි කිරීමට හේතු වන එක් පුද්ගලයෙකු මත දැඩිව පදනම් වන වර්තමාන ක්‍රියාවලිය කෙරෙහි දැඩි අවධානය යොමු කරන මැ.ප්‍ර.නි.ම. වර්තමාන ක්‍රියාවලිය සමාලෝචනය කරන මෙන් අයැද සිටී.

වර්තමාන ක්‍රියාවලිය යටතේ තැපැල් ඡන්ද අයදුම්පත් ගණනාවකට කිසිදු පිළිතුරක් ලැබී නොතිබුණු බවට මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වී ඇත. කුරුණෑගල මහව ඩිපෝවට අදාළ අයදුම්පත් 56ක් යොමු කර තිබූ අතර ඉන් 39කට තැපැල් ඡන්දය ලැබී තිබුණි. අයදුම්පත් 4ක් ප්‍රතික්ෂේප වී තිබූ අතර අයදුම්පත් 13කට කිසිදු පිළිතුරක් ලැබී නොතිබුණි. එමෙන් ම අනුරාධපුර මිහින්තල ප්‍රාදේශීය සභාව විසින් අයදුම්පත් 10ක් යොමු කර තිබූ අතර ඉන් එක් අයදුම්පතකට ඡන්දය ලැබී තිබුණි. එක් අයදුම්පතක් ප්‍රතික්ෂේප වී තිබූ අතර අයදුම්පත් 08ට කිසිදු පිළිතුරක් ලැබී නොතිබුණි. මැ.ප්‍ර.නි.ම. මෙම ගැටලුව අදාළ දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන් වෙත යොමු කළද අතුරුදහන් වී ඇති ඡන්ද සඳහා වගවීමක් ඇති ආකාරයේ පිළිතුරක් ලබා දීමට ඔවුන් අසමත් විය. මෙම කාරණය පිළිබඳ සොයා බැලීමට ඉක්මන් පියවරක් ගන්නා ලෙස මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමසාරිස්වරයාගෙන් අයැද සිටී.

## <u>සර්ව ජන ඡන්ද බලයට බලපෑමක් ඇති වන කරුණු</u>

මෙම මාධ්‍ය නිවේදනය නිකුත් කරන අවස්ථාව වන විට වාර්තා වන සිද්ධීන් මත පදනම් ව සමහර ඡන්ද මධ්‍යස්ථානවල දී යුද හමුදාව ක්‍රියා කළ ආකාරය කෙරෙහි මැ.ප්‍ර.නි.ම. සැළකිල්ල යොමු කර සිටී. මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවලින් පහත ගෙනහැර දක්වා ඇති සිද්ධීන් සහ මාධ්‍ය නිවේදන අංක 01හි ගෙන හැර දැක්වූ සිද්ධීන් මැතිවරණයේ විනිවිද බව කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.

ලංකාවේ විවිධ ප්‍රදේශවල වාර්තා වූ අහිතකර කාලගුණ තත්ත්වය හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අඩුවක් පැවති බව ද මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. නැගෙනහිර පළාතෙන් සහ මන්නාරම දිස්ත්‍රික්කයෙන් ලැබුණු වාර්තා අනුව තද වැසි සහ ගං වතුර තත්ත්වය නිසා ඡන්දය ප්‍රකාශ කළ සංඛ්‍යාවේ අඩුවක් දක්නට ඇත. තැපැල් ඡන්දයේ ඉතිරි දිනවලට ද මෙම අහිතකර කාළගුණ තත්ත්වය දිගටම මුහුණ දීමට සිදු වුවහොත් එය ඡන්ද දිනය කෙරෙහි බලපානු ඇත. එසේ හෙයින් ඡන්දදායකයින්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමසාරිස්වරයාගෙන් අයැද සිටී. ඉහත සඳහන් කළ පොදු තත්ත්වයන්ට අමතරව තැපැත් ඡන්ද පළමු දිනයට අදාළව සිද්ධීන් ගණනාවක් මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වී ඇති අතර ඒවා පහළ දැක්වේ.

2014-12-23 වන දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල දකුණ බස් ඩිපෝව

පෙ.ව.10:45ට පමණ නිල් බලකාය යනුවෙන් මුද්‍රිත ටී ෂර්ට් හැඳගත් පිරිසක් ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටත සැරිසරමින් සිටින බවට මැ.ප්‍ර.නි.ම ට වාර්තා විය.

**කොළඹ දිස්ත්‍රික්කය, කොළඹ 02 සර්.චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය**

ඉහත මධ්‍යස්ථානයට ඇතුල්වන ස්ථානයේ සිටි ආරක්ෂක නිලධාරියා විසින් මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකට ඡන්ද මධ්‍යස්ථානය වෙතට යාමට අවසර ලබා නොදෙන ලදී. විදුලි බල මණ්ඩලයේ අදාළ ගොඩනැගිල්ලේ ඡන්දය සළකුණු කිරීමක් සිදු නොවන බව ආරක්ෂක නිලධාරියා විසින් නිරීක්ෂකට දැනුම් දී තිබුණි. මැ.ප්‍ර.නි.ම විසින් විදුලි බල මණ්ඩලයේ බලධාරීන්ට දැනුම් දීමෙන් පසු මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකට අවශ්‍ය අවසරය ලැබුණි.

**මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

මහින්ද රාජපක්ෂ ජනාධිපතිගේ විශාල පෝස්ටරයක් ඡන්ද මධ්‍යස්ථානය අසළ ගොඩනැගිල්ලේ ප්‍රදර්ශනය වන බව මැතිවරණ නිරීක්ෂක වාර්තා කරන ලදී. මෙම ගොඩනැගිල්ල ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් වන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඡන්දය සළකුණු කිරීමේ ස්ථානයට එය සෘජුව දර්ශනය වේ.

**වව්නියාව ලං.ග.ම බස් ඩිපෝව**

ඡන්ද මධ්‍යස්ථානයක් පිහිටි වව්නියාව බස් ඩිපෝ භූමිය තුළ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පෝස්ටර් ප්‍රදර්ශනය වන බව මැ.ප්‍ර.නි.ම නිරීක්ෂක වාර්තා කරන ලදී.

**මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය ලං.ග.ම බස් ඩිපෝව**

ඉහත ස්ථානයේ පිහිටි ඡන්ද මධ්‍යස්ථානයේ දී ඡන්දදායකයින්ට සිය ඡන්ද පත්‍රිකා සළකුණු කොට කවරයට දමා ඇලවීමට පෙර සළකුණු කිරීමේ නිළධාරියාට පෙන්වීමට සිදු වූ බව මැ.ප්‍ර.නි.මට දන්වන ලදී. මැප්‍රනිම මේ සම්බන්ධයෙන් මහනුවර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාගෙන් විමසූ විට ඔහු එම චෝදනාව ප්‍රතික්ෂේප කර සිටි අතර එම ඡන්ද මධ්‍යස්ථානයේ ඔහුගේ නියෝජිතයෙකු ද සිටි අතර එවන් සිදුවීමක් සිදු නොවූ බව ප්‍රකාශ කරන ලදී.

**මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම බස් ඩිපෝව**

ජාතික හැඳුනුම්පත වෙනුවට ලංගම හැඳුනුම්පත රැගෙන පැමිණි ඡන්දදායකයින් සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සංධානයේ ඡන්දපොළ නියෝජිතයින් අතර බහින්බස් වීම් හටගෙන තිබූ බව මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂක වාර්තා කරන ලදී. එක්සත් ජනතා සංධානයේ නියෝජිතයින් ඡන්දය දැමීම සඳහා ජාතික හැඳුනුම්පත අත්‍යවශ්‍ය බව තර්ක කර සිට ඇති අතර එක්සත් ජාතික පක්ෂ නියෝජිතයින් ප්‍රකාශ කර ඇත්තේ ලං.ග.ම. විසින් නිකුත් කළ හැඳුනුම්පත භාවිතා කළ ද ඡන්දය භාවිත කළ හැකි බවයි. මෙම ගැටුම්කාරී තත්ත්වය සමතයකට පත් කිරීමට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ද එම ස්ථානයට කැඳවා ඇත .

**ගම්පහ දිස්ත්‍රික්කයේ මිරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

නියෝජ්‍ය අමාත්‍ය සරණ ගුණවර්ධන සහ තවත් පුද්ගලයන් දෙදෙනෙකු ඉහත ඡන්ද මධ්‍යස්ථානයට ඇතුල් වී ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව සහ භාවිතා කර ඇති ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ඡන්දපොළ නියෝජිතයාගෙන් විමසූ බවට මැ.ප්‍ර.නි.මට වාර්තා විය.

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම දිස්ත්‍රික් රෝහල**

ස්වාධීන රූපවාහිනිය මගින් විකාශනය කරන ලද ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් සිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරමින් සිදු කළ කතාව පළමු මහලේ රූපවාහිනී යන්ත්‍ර මගින් ප්‍රදර්ශනය කළ බව ද එහි දෙවන මහලේ තැපැල් ඡන්දය පවත්වා ගෙන ගිය බව ද වාර්තා වේ.

**මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ බස් ඩිපෝව**

ඉහත ඡන්ද මධ්‍යස්ථාන භූමියේ ප්‍රකාශනය කරමින් තිබූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පෝස්ටර් මැතිවරණ කොමසාරිස්වරයා ලබා දී තිබූ උපදෙස් අනුව ඉවත් කර නොතිබුණි.

**ගම්පහ දිස්ත්‍රික්කයේ කිරිල්ලවල කලාප අධ්‍යාපන කාර්යාලය**

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ අඩි 15ක් පමණ උස ප්‍රචාරක පුවරුවක් ඡන්ද මධ්‍යස්ථානය තුළ සවි කර තිබූ බවට මැ.ප්‍ර.නි.ම නිරීක්ෂක වාර්තා කරන ලදී.

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක කලාප කාර්යාලය**

ත්‍රිකුණාමලය ඩිපෝවේ බස් රථ දෙකකින් සිවිල් ආරක්ෂක නිලධාරීන් ඡන්දය භාවිතා කිරීම සඳහා ප්‍රවාහනය කළ බව මැ.ප්‍ර.නි.ම නිරීක්ෂක වාර්තා කරන ලදී. එම බස් රථවල පසෙක ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ප්‍රචාරක පෝසටර් අලවා තිබුණි. මේ පිළිබඳ ව මැ.ප්‍ර.නි.ම නිරීක්ෂක ත්‍රිකුණාමලය ඩිපෝවෙන් විමසූ විට එවන් අරමුණක් සඳහා බස් රථ නිදහස් කර නොමැති බව ද පවසන ලදී. මැ.ප්‍ර.නි.ම නිරීක්ෂක තහවුරු කරන ලද්දේ ඩිපෝවේ කළමණාකරු වන විජිත ධර්මසිරි මහතා ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සංධාන මන්ත්‍රීවරයෙකු ද වන බවයි.

**අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය**

දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ සිටි පොලිස් නිලධාරීන්ට දැනුම්දීමක් කරන තුරු එම මධ්‍යස්ථානය සඳහා පත් කර සිටි මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂකට ඡන්ද මධ්‍යස්ථානයට ඇතුල් වීමට අවසර ලබා නොදුනි.

**කළුතර දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය**

ඉහත ස්ථානයේ පැවැති ඡන්ද මධ්‍යස්ථානයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිගේ බැනරයක් මනාව ප්‍රදර්ශනය කරමින් තිබූ බව මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලදී. මේ පිළිබඳ ව මැ.ප්‍ර.නි.ම නිරීක්ෂක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.පී. චන්ද්‍රාවතී මහත්මියගෙන් විමසූ විට එය ඉවත් කිරීම පොලිසියේ කාර්යභාරයක් බවත් කලාප අධ්‍යාපන කාර්යාලයකට කිසිවක් සිදු කළ නොහැකි බවත් දන්වා ඇත.

**මුලතිව් දිස්ත්‍රික්කයේ ආලම්පිල්හි සිංහ රෙජිමේන්තුවේ 591වන බලකා ප්‍රධාන කාර්යාලය**

ඡන්ද පත්‍රිකා සළකුණු කිරීම රජයේ නිලධාරීන්ට පැහැදිලි ව පෙනෙන පරිදි සළකුණු කිරීමේ ස්ථානය සකසා තිබූ බැවින් ඡන්දය ප්‍රකාශ කිරීමේ දී රහසිගතභාවය ආරක්ෂා නොවන බව මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලදී. මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක විසින් මෙම කරුණ සහතික කිරීමේ නිලධාරියාගේ සහ මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දන්වන ලදී. මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක විසින් මෙම කරුණ මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ට ලිඛිතව පැමිණිලි කර ඇත. කරුණු විමසීමේ දී සහතික කිරිමේ නිලධාරියා මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂකට දැනුම් දී ඇත්තේ ඡන්දය ප්‍රකාශ කරන පුද්ගලයා තමන්ට පැහැදිලිව දැකීමට අවශ්‍ය බැවින් එලෙස මධ්‍යස්ථානය සකස් කළ

බවයි. පසුව එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානය වෙනස් කර සකසන ලදී. කෙසේ වුව ද මේ වන විටත් එම මධ්‍යස්ථානයට ලියාපදිංචි ඡන්ද 391න් 154ක් ප්‍රකාශ කර තිබුණි.

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.



ආචාර්ය පී. සරවනමුත්තු

සම කැඳවුම්කරු